**ඇඹිලිපිටිය නගර සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 27 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 16 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 06 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**---------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**-----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ණයහිමියන් සහ තැන්පත් ගිණුම් වලට අදාලව ඉකුත් වර්ෂය අවසානයට පැවති ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන ඒමේදී එකතුව රු. 4,636,776 කින් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් ජංගම වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ආ) ඉකුත් වර්ෂය අවසානයට සමුච්චිත අරමුදලේ පැවති ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන ඒමේදී රු. 439,360 කින් වැඩියෙන් දැක්වීම හේතුවෙන් හිමිකම් එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු එකතුව රු. 28,952 ක් වූ පුස්තකාල පොත් ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී ලැබී පසුව අගරු වී තිබුණු එකතුව රු. 75,437 ක් වූ චෙක්පත් 02 ක් අගරු චෙක්පත් ගිණුමෙහි ගැලපීමකින් තොරව ගිණුම් වලින් කපාහැර තිබීම හේතුවෙන් ජංගම වත්කම් රු. 75,437 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) කර්මාන්ත ණයගැතියන් යටතේ සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු. 637,480 ක් සමුච්චිත අරමුදල් ගිණුම හර කර තිබීම හේතුවෙන් සමුච්චිත අරමුදල එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් විෂයයන් 03 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 18,233,169 ක වෙනසක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 19 කට අදාලව කාණ්ඩ එකතු ලේඛනය අනුව ශේෂය හා මූල්‍ය ප්‍රකාශන අතර රු. 1,044,243 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු. 5,733,252 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ රු. 2,320,011 ක් වූ ලී බඩු හා සවිකිරීම් ශේෂ සඳහා විස්තරාත්මක උපලේඛන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

### 1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

--------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (අ) මුදල් රෙගුලාසි 371(2) | 2007 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල අවස්ථා 12 කදී ගෙවා තිබූ එකතුව රු. 932,291 ක් වූ අතුරු අග්‍රිම 2017 ජනවාරි වනවිටත් පියවා නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 571 | 2013 වර්ෂයේ සිට 2014 සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල එකතුව රු. 349,752 ක් වූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 34,044,357 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 25,367,722 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 8,676,635 ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය රු. 8,676,635 කින් වැඩිවීම කෙරෙහි විෂයයන් 04 ක පුනරාවර්තන ආදායම් රු. 8,054,214 කින් වැඩිවීම හා විෂයයන් 03 ක පුනරාවර්තන වැය රු. 2,383,843 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| | 000’ | 000’ | 000’ |
| වරිපනම් හා බදු | 18,010 | 17,750 | 29,726 |
| බදු කුලී | 11,569 | 14,438 | 6,804 |
| බලපත්‍ර ගාස්තු | 2,329 | 3,382 | 2,201 |
| වෙනත් ආදායම් | 45,500 | 42,297 | 18,015 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරෙන්තු හා දඩ හා රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 45 හා සියයට 28 කින් අඩුවී තිබුණි.

### 2.3.3 බදුකුලී

--------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පල්ලෙගම පොදු වෙළඳපල කඩකාමර 27 කින් 2012 මාර්තු සිට 2016 සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව හිඟහිට තිබූ එකතුව රු. 505,000 ක බදු කුලී 2016 දෙසැම්බර් වනවිටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) 2016 ජූලි 31 දින වනවිට පල්ලෙගම බස් නැවතුම්පලෙහි පිහිටි තාවකාලික කඩකාමර 30 කින් අයවිය යුතු එකතුව රු. 2,909,300 ක කුලිය මාස 56 සිට මාස 01 දක්වා කාලයක් හිඟහිට තිබූ අතර, කඩකාමර 22 කට අදාලව බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

### 2.3.4 වෙනත් ආදායම්

-----------------

බස් රථගාලේ බස් නැවතුම් ගාස්තු ආදායම් ලෙස 2016 වර්ෂය වෙනුවෙන් රු. 1,001,000 ක් ඇස්තමේන්තු කර තිබුණද, බස් රථගාලෙන් සභාවට කිසිඳු ආදායමක් අයකර ගැනීමට 2017 ජනවාරි වනවිටත් අපොහොසත් වී තිබුණි.

### 2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

2016 ජනවාරි සිට අගෝස්තු 21 දින දක්වා කාලයට අදාලව සබරගමුව පළාත් සභාව වෙත ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණයෙන් උසාවි දඩ මුදල් ලෙස රු. 376,964 ක මුදලක් ලැබී තිබුණු අතර, 2017 ජනවාරි වනවිටත් එකී මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛනය අනුව කර්මාන්ත වෙනුවෙන් රු. 133,300,000 ක් ඇස්තමේන්තුගත කර තිබුණු අතර, වෙන් වෙන් වශයෙන් කර්මාන්ත හඳුනාගෙන නොතිබුණි. වර්ෂය අවසානයේදී නගර සභා ප්‍රතිපාදන යටතේ එකතුව රු. 9,385,454 ක් වූ කර්මාන්ත 16 ක්ද, පළාත් සභා ප්‍රතිපාදන යටතේ එකතුව රු. 6,637,943 ක් වූ කර්මාන්ත 08 ක්ද, මධ්‍යම රජයේ

ප්‍රතිපාදන යටතේ වටිනාකම රු. 3,445,854 ක් වූ කර්මාන්ත 07 ක්ද වශයෙන් එකතුව රු. 19,469,251 ක් වැයකර කර්මාන්ත 31 ක් නිමකර තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

1991 අගෝස්තු සිට 2011 පෙබරවාරි දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් නිලධාරීන් 07 දෙනෙකුට අදාල එකතුව රු. 76,977 ක් වූ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ප්‍රමාදවී ගෙවීම හේතුවෙන් රු. 72,386 ක අධිභාර ගෙවීමට සිදුවී තිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු භූමි ප්‍රමාණය හෙක්ටයාර 3.99 ක් හා පර්චස් 13.2 ක් වූ ඉඩම් කොටස් 18 ක මායිම් නිරවුල් කර ආරක්ෂිත වැට හෝ තාප්ප ඉදිකර එකී සියළු ඉඩම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 21 දිනැති මහ සභා තීරණ අනුව හිඟ වරිපනම් එකතු කිරීමට පත් කරන ලද දේපල තහනම් කිරීමේ නිලධාරියාට අධි ගාස්තුවෙන් සියයට 15 ක කොමිස් මුදලක් ගෙවිය හැකි වුවද, හිඟ වරිපනම් වටිනාකම නිවැරදිව ලැයිස්තුගත කර නොතිබීම නිසා කොමිස් මුදල් ගෙවීමේ පදනම නිවැරදිව හඳුනා නොගැනීම හේතුවෙන් 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එකතුව රු. 210,466 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර, 2017 අගෝස්තු වනවිට ඉන් රු. 26,546 ක් පමණක් අයකර ගෙන තිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රු. 779,177 ක් වැයකර තිබුණු තෙල්බදුආර මෝලවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය සම්බන්ධයෙන් සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මාර්ගයේ ආරම්භක මීටර් 20 තුල කොන්ක්‍රීට් පෘෂ්ඨය ඉතා දුර්වල මට්ටමක පැවතුනු අතර ¾" ගල් මතුවී මතුපිට සිමෙන්ති පෘෂ්ඨය ඉතා පහසුවෙන් ගැලවී යමින් තිබුණි.

(ii) දෙවන මීටර් 20 තුලදී මාර්ගයේ සමස්ථ පළලටම පිපුරුම් 02 ක් හා මීටර් 60 හා මීටර් 80 අතර මාර්ගතලය මැදින් පිපුරුමක් මතුවී තිබුණි.

(iii) මාර්ගයේ මීටර් 80 දී සමස්ථ පළලටම මාර්ගය පුපුරා දකුණු පස අයිනෙන් කොටසක් මාර්ගයෙන් වෙන්වෙන තරමට පුපුරා තිබුණු අතර, අවසාන මීටර් 20 සිට ඉදිරියට සම්පූර්ණ මාර්ගයේ නිමාව සතුටුදායක මට්ටමක නොපැවතුණි.

(ආ) ගිවිසුම්ගත වටිනාකම රු. 430,745 ක් වූ මොදරවාන මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය සම්බන්ධයෙන් සිදුකල භෞතික පරීක්ෂාවේදී මාර්ගයේ කොන්ක්‍රීට් මිශ්‍රණය දුර්වලවීම හේතුවෙන් කොන්ක්‍රීට් පෘෂ්ඨය මතුපිට ගල් මතුවී තිබූ අතර වැලි, සිමෙන්ති, ගල් මිශ්‍රණය ඉතා පහසුවෙන් ගැලවී යමින් තිබුණි. තවද, මෙම කර්මාන්තය අධීක්ෂණය කිරීම සඳහා කාර්මික නිලධාරිවරයකුට වගකීම පවරා ඇති බවට ලිපිගොනු අනුව තහවුරු නොවුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 16 කට අදාලව එකතුව රු. 6,715,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 04 කට අදාලව අයවැයගත ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා රු. 254,631 ක වියදම් කර තිබුණි.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

## 4.4 අභ්‍යන්තර විගණනය

------------------------

නගර සභාව සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 4.5 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

-----------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දින වනවිට ගණනය කල හැකි වටිනාකම රු. 2,811,737 ක් වූ විගණන විමසුම් 03 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ගිණුම් වලින් අත්හැරීම් තිබීම |
| | | (ii) | වැඩියෙන් සටහන් කිරීම |
| | | (iii) | උපයෝගී ලේඛන හා මූල්‍ය ප්‍රකාශන නොසැසඳීම |
| | | (iv) | වැය ලෙජරය හා මූල්‍ය ප්‍රකාශන නොසැසඳීම |
| (ආ) | ආදායම් පරිපාලනය | | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | | ගුණාත්මකභාවය අවම වීම |
| (ඈ) | අයවැය පාලනය | (i) | ප්‍රතිපාදන ඉතිරිවීම |
| | | (ii) | ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීම |